**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 243**

**ආයතනයේ නම - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 243

நிறுவனத்தின் பெயர் - **மோட்டார் வாகன போக்குவரத்து திணைக்களம்**

பாராளமன்றத்தின் அரச கணக்கு குழுவினால் முனவைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் **119 (4)** இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series Number - 243

Name of the Institution - Department of Motor Traffic

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee On Public Accounts in terms of standing order No. 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 243

ආයතනයේ නම - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

| | කමිටුව විසින් හදුනා ගන්නා ලද අඩුපාඩු | අඩු පාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග /වර්ථමාන ප්‍රගතිය |
|---|---|---|
| 1. | • විගණන විමසුම් මගින් 2014 වසරේ දී ආයතනයට ඉදිරිපත් කළ , එහෙත් 2019 වසර දක්වා පිළිතුරු නොලැබුණු "ආගමික ස්ථාන සඳහා ලබා දුන් බලපත්‍ර මත ආනයනය කළ වාහන 158 ක බලපත්‍රලාභින්ගේ නම හෝ බලපත්‍රයට අදාළ පැවරුම් කොන්දේසි හෝ වෙනස් කරමින් වාහන ලියාපදිංචි කර තිබීම හා වාහන 120 ක නිෂ්පාදිත වර්ෂයද වෙනස් කර ලියාපදිංචි කිරීම" යන කරුණද ඇතුළත් වූ විගණකාධිපතිගේ පූර්ව නිර්දේශ 25ක් අඩංගු කරුණු, 2019.10.23 දින පැවති රජයේ ගිණුම් කාරක සභාවේදී විමර්ශනය කර එකී කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශයන් සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මේ දක්වා සාධනීයව කටයුතු නොකිරීම.<br><br>• මේ සම්බන්ධයෙන් 2020 වසරේ දී සිදු කරනු ලැබූ දෙපාර්තමේන්තු විමර්ශනයේ දී එවකට සිටි ග.නි. විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ ලිපිගොනු 118 ට අදාළව විමර්ශන වාර්තාවක් ලබා ගෙන එම විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳව කාරක සභාවට වාර්තා කරන ලෙසත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ග.නි.ට ත් නිර්දේශ කරන ලදි. | • විශ්‍රාමික මහ අධිකරණ විනිසුරුවරයෙකු, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපතිවරයෙකු සහ ගණකාධිකාරී සේවයේ විශ්‍රාමික විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර විමර්ශන කටයුතු සිදුකරමින් පවතී.<br><br>• අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශනටන්ට අදාළ වාර්ථාවක් ගෙන්වා ගෙන රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන ලදී. |
| 2. | • විගණකාධිපතිවරයාගේ 2023.09.12 දිනැති විශේෂ විගණන වාර්තාවෙහි අඩංගු කරුණු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින්ට විරුද්ධව දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති විනය ක්‍රියා මාර්ගයන්හි ප්‍රගතිය. | • විශ්‍රාමික මහඅධිකරණ විනිසුරුවයෙකු, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපතිවරයෙකු සහ ගණකාධිකාරී සේවයේ විශ්‍රාමික විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර විමර්ශන කටයුතු සිදුකරමින් පවතී. |

| | | |
|---|---|---|
| | • මෙම කටයුත්ත සඳහා දෙපාර්තමේන්තුව තුළ පත්කළ විමර්ශන කමිටුවට අවස්ථා දෙකකදී පත්කරන ලද නිලධාරීන් විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කමිටුවේ කාර්යභාරය ඉටුනොකිරීමට අදාළව එම නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර සති තුනක් ඇතුළත කාරක සභාවට වාර්තා කරන ලෙස ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි.ටත් නිර්දේශ කරන ලදී. | • ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයෙන් විමර්ශනයක් සිදු කර විමර්ශන වාර්ථාව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කර ඇත. |
| 3. | • අමප/16/1307/709/061 හා 2016 සැප්තැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නීත්‍යානුකූල රේගු ක්‍රියාවලියකින් තොරව ආනයනය කරන ලද යතුරු පැදි , ඒවායේ ඉන්ධන ධාරිතාවය පදනම් කර ගනිමින් අධිභාරයක් අය කිරීමකට යටත්ව ලියාපදිංචි කිරීමේ දී සිදුව ඇති අක්‍රමිකතා. | • මේ සම්බන්ධව විමර්ෂණයන් සිදු කර අතුරු වාර්ථාව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන ලදී. අවසන් වාර්ථාව ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| 4. | • 2020,2021,2022 සහ 2023 මූල්‍ය වර්ෂයන්හි විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු හා වර්තමාන කාර්යසාධනය සමාලෝචනය. දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් නිකුත් කළ 2020 ,2021,2022 හා 2023 වර්ෂවල විගණකාධිපති වාර්තාවන්හි ඇතුළත් කරුණු 18 ක් සහ 8 ක් පිළිවෙළින් සලකා බැලූ කාරක සභාව , එහි සඳහන් බොහෝ කරුණු තුළින් විශාල මූල්‍ය වංචා හා දූෂණ සිදු වී ඇති බව නිගමනය කිරීම. | • මෙ සම්බන්ධව විමර්ශන සිදුකිරීම සඳහා රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ විමර්ශන අංශයෙන් විමර්ශන සහකාරවරුන්ගේ සැසඳුම්ලත් කමිටු පත්කර ඇත. |
| 5. | • ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍ර නිකුත් කිරීමේ දී සිදුව ඇති අක්‍රමිකතා | • මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර විමර්ශන වාර්ථාව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කර ඇත. |
| 6. | • කාරක සභාවේ පොදු නිර්දේශ<br>✓ දෙපාර්තමේන්තුව තුළ සිදු වී ඇති වංචා , දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධයෙන් අදාළ විමර්ශන සිදු කර වැරදිකරුවන්ට රාජ්‍ය ආයතනයන්හි පවතින විනය කාර්ය පටිපාටිය කළ දඬුවම් පැනවීම අනිවාර්ය වන බව සහ ඒ සඳහා විනය බලධරයා විසින් විනය පරීක්ෂණ සිදු කිරීම අනිවාර්ය වන බව, | • විමර්ශනයක් සිදු කර හඳුනාගන්නා ලද වැරදි කරුවන්ව කාරක සභාවේ නිර්දේශය අනුකූලව කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| | ✓ සියලු දෙපාර්තමේන්තු පරීක්ෂණ සඳහා ප්‍රවාහන , මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ගේ සාධනීය මැදිහත්වීමක් සහ අධීක්ෂණයක් තිබිය යුතු බව,<br>✓ විනය ක්‍රියාමාර්ගයන් වලින් අනාවරණය වන අපරාධමය වැරදි සම්බන්ධයෙන් රටේ පවතින නීතියට අනුව අධිකරණ ක්‍රියාදාමයක් හරහා දඬුවම් පැමිණවීම කළ යුතු බවත්,<br>✓ විගණන වාර්තා වලින් අනාවරණය කර ඇති හා කාරක සභාව ඉදිරියේ හෙළිදරව් වන අපරාධමය වැරදි සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අදාළ වාර්තා නීතිපති වෙත යොමු කර නීතිය බලාත්මක කිරීමේ ආයතන මගින් වරදකරුවන්ට දඬුවම් පැමිණවීම සිදු කළ යුතු බව. | |

**බිමල් නිරෝෂන් රත්නායක (පා.ම)**
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍ය